WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,657—1959 ජනවාරි 31 වැනි සෙනසුරාද—31.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1941 අංක 27 දරණ කම්කරු පඩි සහා ඇඳු පනත

**නිවේදනයයි**

වර්ෂ 1943 අංක 40 දරන ආඥා පනතින් සංශොධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සහා ආඥා පනතේ 28 වන වගන්තිය යටතේ ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව මීට යාව ඇති උප ලේඛනයෙහි දක්වා ඇත්තාවූ තීරණයන් ගරු කම්කරු, නිවාස හා සමාජ සේවා ඇමති තුමන් විසින් අනුමත කරන ලද බව එකී කම්කරු පඩි සභා ආඥා පනතේ 27 (3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණයෝ වර්ෂ 1959 පෙබරවාරි මස පළමු වන දින වලංගු බවට පැමිණෙති.

සී. බී. කුමාරසිංහ,
වැඩ බලන ස්ථිර ලේකම් වරයා,
කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යාංශය.

1959 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇතිකරනදුව වර්ෂ 1945 අගෝස්තු මස 10 වන දින අංක 9,447 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උප ලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද වර්ෂ 1946 පෙබරවාරි මස 22 වන දින අංක 9,523 සහ වර්ෂ 1948 පෙබරවාරි මස 27 වන දින අංක 9,837 දරන ගැසට් පත්‍රවලද වර්ෂ 1951 මාර්තු මස 30 වන දින අංක 10,229 වර්ෂ, 1953 ජූනි මස 29 වන දින අංක 10,542 සහ වර්ෂ 1955 ජූනි මස 30 වන දින අංක 10,811 දරන විශේෂ ගැසට් පත්‍ර වලද වර්ෂ 1957 දෙසැම්බර් මස 27 වන දින අංක 11,224 හා වර්ෂ 1958 පෙබරවාරි මස 28 වන දින අංක 11,268 දරන ගැසට් පත්‍රවලද වර්ෂ 1958 අගෝස්තු මස 30 වන දින අංක 11,509 දරන විශෙෂ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 1958 නොවැම්බර් මස 28 වන දින අංක 11,603 දරන ගැසට් පත්‍රයේද පළ කරන ලද නිවේදනයන්හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්දවූ ද තීරණ, එම උප ලේඛනයේ II වන කොටසෙහි මෙහි පහත දැක්වෙන පරිද්දෙන් තව දුරටත් වෙනස් වේ.

(1) ‘‘ කවර මාසයක වුව වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු විශෙෂ දීමනාවේ රේටය ’’ යන ශීර්ෂය යටතේ—

(I) එහි (ඒ) උප ශීර්ෂයට අයත් කොටසෙහි—

(අ) ‘‘ 1.00 ’’ යන ඉලක්කම් අස්කොට ඒ වෙනුවට ‘‘ 1.10 ’’ යන ඉලක්කම් යෙදීමෙන් සහ

(ආ) ‘‘ 1.10 ’’ යන ඉලක්කම් අස්කොට ඒ වෙනුවට ‘‘ 1.20 ’’ යන ඉලක්කම් යෙදීමෙන් ද

(2) එම කොටසෙහි 3 වන තීරයේ දැක්වෙන සංවිධාන භාවිත කරන අන්දම දක්වන ගණන් වක්‍ර අස්කොට ඒවා වෙනුවට පහත දැක්වෙන අභිනව ගණන් වක්‍ර යෙදීමෙන් ද වේ :—

### I වන ගණන් වක්‍රය

**ජීවන වියදම් අංකය ඉහළ නැංග විට විශෙෂ දීමනාව**

| ජීවන වියදම් අංක | නුපුහුණු කම්කරුවෝ | අඩ පුහුණු කම්කරුවෝ I සහ II වර්ග සහ නම්කානම්වරු සහ මුරකරුවන් ඇතුළු පුහුණු කම්කරුවෝ | කර්මාන්ත ඉගෙනගන්නන් සහ වැඩ පුරුදුවන්නෝ: 1 වන අවුරුද්ද | 2 වන අවුරුද්ද | 3 වන අවුරුද්ද | 4 වන අවුරුද්ද |
|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 100·1–101·8 | 2 0 | 2 10 | 1 10 | 1 20 | 1 48 | 1 63 |
| 101·9–103·6 | 2 3 | 2 13 | 1 11 | 1 21 | 1 50 | 1 65 |
| 103·7–105·4 | 2 6 | 2 16 | 1 12 | 1 22 | 1 52 | 1 67 |
| 105·5–107·2 | 2 9 | 2 19 | 1 13 | 1 23 | 1 54 | 1 69 |
| 107·3–109·0 | 2 12 | 2 22 | 1 14 | 1 24 | 1 56 | 1 71 |

331—ජේ. ඇන්. ආර් 152—3,950 (1/59)

## II වන ගණන් වක්‍රය

### ජීවන වියදම් අංකය පහළ බැස්ස විට විශෙෂ දීමනාව

| ජීවන වියදම් අංක | නුපුහුණු කම්කරුවෝ | අඩ පුහුණු කම්කරුවෝ I සහ II වර්ග සහ කම්කානම්වරු සහ මුරකරුවන් ඇතුළු පුහුණු කම්කරුවෝ | කර්මාන්ත ඉගෙනගන්නන් සහ වැඩ පුරුදුවන්නෝ — 1 වන අවුරුද්ද | 2 වන අවුරුද්ද | 3 වන අවුරුද්ද | 4 වන අවුරුද්ද |
|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 100·0–98·3 | 1 97 | 2 7 | 1 9 | 1 19 | 1 46 | 1 61 |
| 98·2–96·5 | 1 94 | 2 4 | 1 8 | 1 18 | 1 44 | 1 59 |
| 96·4–94·7 | 1 91 | 2 1 | 1 7 | 1 17 | 1 42 | 1 57 |
| 94·6–92·9 | 1 88 | 1 98 | 1 6 | 1 16 | 1 40 | 1 55 |
| 92·8–91·1 | 1 85 | 1 95 | 1 5 | 1 15 | 1 38 | 1 53 |

මේ උප ලේඛනයෙහි කර්මාන්ත ඉගෙනගන්නන් හා වැඩ පුරුදු වන්නන් කෙරෙහි ලා සැලකෙන විට " වර්ෂය " යන්න පහත දක්වෙන දවස්ද ඇතුළුව, නොකඩවා රක්ෂාව කළ දින 365 කින් යුක්ත වූවක් ලෙස සලකනු ලැබේ :—

(ඒ) එබඳු කර්මාන්ත ඉගෙන ගන්නකුට හෝ වැඩ පුරුදු වන්නකුට හෝ සේව්‍යයා විසින් 25 වන වගන්තිය යටතේ දෙන ලද සෑම නිවාඩු දවසක් ;

(බී) සේව්‍යයාගේ අනුමතියෙන් වැඩට නොපැමිණි සෑම දවසක් ;

(සී) එබඳු කර්මාන්ත ඉගෙනගන්නකු හෝ වැඩ පුරුදු වන්නකු තම රක්ෂාව නිසාත් එය කරන අතර තුරදීත් ඇති වූ අනතුරකින් ලැබූ තුවාලයක් හේතුකොටගෙන වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඩී) කම්කරු වන්දි පිළිබඳ ආඥා පනතේ (117 වන පරිච්ඡෙදය) III වන උප ලේඛනයේ විස්තර වන කිසියම් වෘත්තීය රෝගයක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ; සහ

(ඊ) එබඳු කර්මාන්ත ඉගෙනගන්නකුට හෝ වැඩ පුරුදු වන්නකුට වැඩ දීමට සේව්‍යයාට නොපුළුවන් වන සෑම දවසක් ;

එහෙත් 24 වන වගන්තිය යටතේ සතිපතා නිවාඩු දවස වශයෙන් නියම කරන ලද දිනය ඊට නොඇතුළත්.

එසේද වුව කිසිම අවුරුද්දක් වෙනුවෙන් ඉහත සඳහන් (ඒ), (බී), (සී), (ඩී) සහ (ඊ) යන වගන්ති යටතේ ඇතුළත් විය හැකි දින ගණන මුළුමනින් 77 කට වැඩි නොවිය යුතුය ''.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී